සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

21 S I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ...................................... සිංහල භාෂාව හා සාහිත්‍යය- I කාලය : පැය 01 යි.

වැදගත් :
- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40කි.
- ✳ 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

✳ **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

(01) ඔවුන් අප ව **අතපල්ලෙන් වැටුණ** දරුවන් සේ සැලකීම සාධාරණය
(1) දුප්පත් (2) අත යටින්
(3) කාත් කවුරුත් නැති (4) ඇනමෙකුගෙන් සරණක් නැති

(02) ''එදා පාන්දර යාමයේ ඇසුණු බිහිසුණු වෙඩි හඬින් මුළු කඳවුරම **ගල් ගැසී ගියේ ය.**''
(1) ගල් මෙන් විය. (2) මහත් සේ බිය විය.
(3) දෙදරා ගියේ ය. (4) සුනු විසුණු විය.

(03) අසනීපය **නිට්ටාවට ම** සුව කළ නොහැකි බව වෛද්‍යවරයා පැවසුවේ ය.
(1) සම්පූර්ණයෙන් ම (2) සාමාන්‍යයෙන්
(3) බාගයක් (4) බෙහෙතෙන්

✳ **අංක 04 සිට 06 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) එම නගරය පිරිසිදු කිරීම සඳහා ගම් වැසියෝ .......................... ඉදිරිපත් වූහ.
(1) නිරායාසයෙන් (2) අනිවාර්යෙන් (3) ස්වයංක්‍රීය ව (4) ස්වෙච්ඡාවෙන්

(05) සමහර භාණ්ඩවල මිල ගණන් අධික නිසා .......................... භාණ්ඩ පරිහරණයට මිනිස්සු පුරුදු වී සිටිති.
(1) ආදේශක (2) පරිපූරක (3) සුලභ (4) ලාභ

(06) ඕස්ට්‍රේලියාවේ ජාතික ඖෂධ .................................... මණ්ඩලයේ නියමු දොස් හාටි 1993 දී ලංකාවට පැමිණ මෙසේ කීහ.
(1) නියමු (2) මිල (3) ප්‍රතිපත්ති (4) තේමා

(07) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ක්ෂණිකව, පිළිබඳව, වළාකුල, පෘෂ්ඨය
(2) ප්‍රවීණ, සණ්ටාර, ප්‍රත්‍යාර්ථ, ගෘහස්ථ
(3) විශේෂණ, රාජාභිෂේකය, විනිශ්චය, අධ්‍යාපනය
(4) දේශගුණික, ලේඛනය, කළමණාකරණය, සාර්ථක

(08) පිහිය, වතුර, වික්‍රමය, නිහාල් යන වචනවල **දෙවන** අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි පාපිල්ල, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල හා රකාරාංශය
(2) කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, රකාරාංශය හා ඇලපිල්ල
(3) රකාරාංශය, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල හා කෙටි පාපිල්ල
(4) ඇලපිල්ල, රකාරාංශය, ඇලපිල්ල හා කෙටි ඉස්පිල්ල

(09) 'දත' යන පදයේ අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,
(1) තාලුජ (2) දන්තජ (3) ඕෂ්ඨජ (4) කණ්ඨජ

(10) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) අනුරාධපුරය, අවිස්සාවේල්ල, නුගේගොඩ, පන්නිපිටිය
(2) පැණි කුරුල්ලා, රාජාලියා, උකුස්සා, මාවලිලා
(3) ගම්පෙරළිය, කලියුගය, යුගාන්තය, විරාගය
(4) නවසීලන්තය, ඩෙන්මාර්කය, තායිලන්තය, නෙදර්ලන්තය

(11) උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ළමයෙක්, ඔවුන්, මම, කුමාරවරු (2) තාත්තෙක්, නරියෙක්, සේවිකාවක, ගිහියෝ
(3) තා, කම්කරුවෝ, ඔවුහු, නාවිකයෝ (4) කම්කරුවෝ, තොපි, වෙළෙන්දෝ, කටුස්සෙක්

(12) නංගී නැටුමක් ''නටයි'' මෙහි නටයි යන ක්‍රියා පදයේ අතීත කාල උත්තම පුරුෂ ඒක වචන ක්‍රියා පදය ලියන්න.
(1) නැටුවා ය. (2) නැටුවෙමි. (3) නැටුවෙමු. (4) නැටූහ.

(13) ''මිහින්තලා'' යන පද අයත් වන්නේ,
(1) පූර්වස්වර ලෝප සන්ධිය (2) ස්වරාදේශ සන්ධිය
(3) ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය (4) ද්විත්ව රූප සන්ධිය

(14) අවස්ථෝචිත යන පදය නිවැරදිව විසන්ධි කර ඇති වරණය තෝරන්න.
(1) අවස්ථා + ඕචිත (2) අවස්ථා + උචිත (3) අවස්ථෝ + චිත (4) අවස් + ථෝචිත

(15) සන්ධි නොවූ පදයක් දැක්වෙන වරණය තෝරන්න.
(1) බළල්ලු (2) සූර්යෝදය (3) පිළියම් (4) පාපියුම්

(16) මිශ්‍ර ක්‍රියාවක් යෙදී නැති වාක්‍ය කුමක් ද?
(1) ඔහු දුවද්දී වැටුණි. (2) නංගී අඬ අඬා පාර පනියි.
(3) කම්කරුවෝ හකුරු කකා තේ බොති. (4) කුරුල්ලා කූඩුව සාදමින් සිටියි.

✳ **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(17) ඔහු **උපකල්පනය** කළ දේ නිවැරදි ය.
(1) ආකල්ප (2) අනුමාන (3) නිශ්චිත (4) තීරණය

(18) බුද්ධිමත් වූ තරමට යමක **යථාර්ථය** දැකිය හැකිය.
(1) සැබෑ තත්වය (2) තේරුම (3) ස්වරූපය (4) යටි අර්ථය

(19) ලංකාවට **උවම්** කළ හැකි රටක් මෙලොව නැත.
(1) සමාන (2) එක් කළ (3) උපමා (4) සමීප කළ

(20) සමානාර්ථ පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) ද්වාරය - දොරටුව, මධුර - මිහිරි, ශ්‍රැති ගෝචර - දර්ශනීය, ශ්වේත - සුදු
(2) ගාම්භීර - ගැඹුරු, කමලකර - විල, ව්‍යසනය - විපත, අධිවාසනා - ඉවසීම
(3) අනූන - අඩු නැති, ප්‍රහර්ෂය - අධි සතුට, පරිශීලනය - හැදෑරීම, සූක්ෂ්ම - සියුම්
(4) ලකළ - අලංකාර, ළපලු - ළා දලු, ප්‍රවිෂ්ට වීම -පැමිණීම විලිකුන් - ඉදුණු

(21) විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන වරණය තෝරන්න.
(1) රුචිය - අභිරුචිය (2) කුලීන - කුලහීන
(3) සමීපස්ථ - දූරස්ථ (4) ප්‍රවීන - ප්‍රතිවීන

(22) ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් සහිත වරණය කුමක් ද?
(1) තරුණයෝ පරිසරය පිරිසිදු කර විසිර ගියහ.
(2) දෙමව්පියන්ගෙන් අවසර ලැබුණොත් මම ගමනට සහභාගි වෙමි.
(3) මව දරුවා ලවා අකුරු ලියවයි.
(4) ගායකයා වේදිකාවට නැගෙද්දී රසිකයෝ අත්පොළසන් දුන්හ.

(23) වැරදි අදහස සහිත වරණය කුමක් ද?
(1) ධාතු ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක් වී ක්‍රියා පදයක් සෑදෙයි.
(2) කර්මකාරක වාක්‍යයක කර්තෘ උක්ත රූප ගනියි.
(3) ''දරුවන් පාසලට පැමිණ ඇත'' යන්න නිවැරදි වාක්‍යයකි.
(4) ශ, ෂ යන අක්ෂර මහාප්‍රාණ අක්ෂර නොවේ.

(24) සෑම පදයකම අන්තඃස්ථාක්ෂරයක් යෙදී ඇති පද සහිත වරණය තෝරන්න.
(1) සතුන්, වමත, නරනිඳු, සුමුදු
(2) පාසල, පමණ, පුටුපෙළ, නිවාස
(3) තීරණය, දූහද, රථය, අනුකම්පා
(4) පරගැති, වතුපිටි, ලක්බිම, ප්‍රදීපය

(25) පරස්වරලෝප සන්ධියට උදාහරණයක් නොවන පදය කුමක් ද?
(1) සදානුස්මරණීය
(2) ශාලාධිපති
(3) සුරඟන
(4) අතිනෑද

✳ **අංක 26, 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

(26) වාසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම.
(1) දී කිරට බළල්ලුත් සාක්කිලු.
(2) කලකදි වහලු කලකදි රස වෙනවාලු.
(3) කිතුල් ගහේ ගිය මිනිහාටත් කියන්න දෙයක් තිබුණලු.
(4) දෙයියන්ගේ හාල් කැවිල වගේ.

(27) අසීරුතාවයෙන් යමක් කිරීම
(1) අඬුව තියෙද්දී අත පුච්චාගන්නේ මොකට ද?
(2) කකුළුවා පැටවුන්ට කෙලින් යන්න කීවා වගේ.
(3) දූලි පිහියෙන් කිරි කන්නා වගේ.
(4) අතු කඩා මොරකන්නා සේ

(28) මුලින් දී ඇති පදයේ අර්ථය වැරදි ලෙස දී ඇති පිළිතුර තෝරන්න.
(1) වල - වනාන්තරය
(2) දළ - දූඩි
(3) සරණ - හැසිරෙන
(4) නල - සුළඟ

✳ **අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවලට ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

(29) (1) ලෝකවාසීන් ගෝලීය උෂ්ණත්වයට මුහුණ දී සිටිති.
(2) වර්තමානයේ තරුණයන් යහමඟට පැමිණෙති'යි බොහෝ දෙනා කියති.
(3) නව ග්‍රන්ථ නව මුහුණුවරකින් ප්‍රකාශයට පත් වෙති.
(4) දරුවන් සහ වැඩිහිටියෝ ශ්‍රමදානයට එක් වූහ.

(30) (1) ඔවුහු ආගන්තුක මිනිස්සු මෙන් හැසිරෙති.
(2) මවක විසින් ඔවුහු යහමඟ යවනු ලබති.
(3) ගම්වාසීන්ට නියඟයෙන් නිවාස අහිමි වූහ.
(4) සතුරෝ පැමිණෙද්දී ගෙහිමියෝ බිය වූහ.

(31) A - මෙරට සංවර්ධනය .................... නව ව්‍යාපෘති සැලසුම් කළ යුතු ය.
B - නව යෝජනා ගෙන ආ .................... සම්මත නොවී ය.
C - ඇතින්න පැටවා .................... නොපෙනී ගියා ය.
D - කාලගුණය අයහපත් .................... බලධාරීහු කියති.
E - බව F - උදෙසා G - නමුත් H - සමඟ
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) E, F, G, H
(2) G, H, F, H
(3) F, H, E, G
(4) F, G, H, E

(32) පහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට නිවැරදි ව දැක්වෙන පිළිතුර තේරන්න.
කුරුල්ලෝ පියාඹද්දී කුඩා දරුවෝ සතුට පළ කළා.
(1) කුරුල්ලන් පියාඹද්දී කුඩා දරුවෝ සතුට පළ කළහ.
(2) කුරුල්ලෝ පියාඹද්දී දරුවෝ සතුට පළ කළහ.
(3) කුරුල්ලන් පියාඹද්දී දරුවන් සතුට පළ කළහ.
(4) කුරුල්ලෝ පියාඹද්දී දරුවන් සතුට පළ කළහ.

(33) ''සාහිත්‍ය විද්‍යාව'' කෘතිය රචනා කළේ කවු ද?
(1) මාර්ටින් වික්‍රමසිංහ මහතා (2) ජී. බී. සේනානායක මහතා
(3) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා (4) කේ. ජයතිලක මහතා

(34) උපමාවක් යෙදී නැති පද්‍ය පාදය කුමක් ද?
(1) දිසෙයි වෙහෙර එහි සුරවිමනක් ලෙසට (2) පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර
(3) සැළෙන පහන සිළු වැනි රඟන ලිය සැදී (4) රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනූ පා තබ තබා

(35) වන විනාශය සිදු කරන මිනිසුන් පිළිබඳ ව අපගේ **නිරන්තර** අවධානය යොමු කළ යුතු ය.
ඉහත වාක්‍යයේ ''නිරන්තර'' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) නිතර (2) ඉඳහිට හෝ
(3) දිනපතා (4) වරින් වර

(36) පහත පද්‍යයේ හතර වෙනි පදය තෝරන්න.
වෙර වීරිය ඇතත් හිතේ
පියකරු බව ඇතත් වතේ
දහදිය නොම සැලෙන ගතේ
.................................................................
(1) සුරුවිරුකම් ඔබට ඇතේ (2) ඔබ පොළොවට බරකි පුතේ
(3) මව් බිම දෙස බලනු පුතේ (4) ඒ මහ වැව් බැඳුණෙ පුතේ

(37) ළා තඹ පත් ලියලන සඳ
දඹ රන්වන් කැටයමක්ය
ඒ තඹපත් මෝරන මඳ
පලා පැහැය මහිමයක්ය
මේ පද්‍ය ඇතුළත් නිර්මාණ සංග්‍රහය කුමක් ද?
(1) සෙංකොට්ටං (2) නිර්මාණ පසුබිම
(3) ප්‍රබද්ධ (4) සක්වාලිහිණි

(38) ''ඉක්බිති උදල්ල තබාලා ඇවිත් ගොනුන් නොදක මහත් දොම්නසට පැමිණෙන්නේ ඔවුන් සොයමින් වනයෙහි ඈත මෑත ඇවිදින්නේ''
මෙම පාඨය උපුටා ගත්තේ,
(1) සද්ධර්මරත්නාවලියෙනි. (2) රාජාවලියෙනි.
(3) මහා කපි ජාතකයෙනි. (4) සද්ධර්මාලංකාරයෙනි.

(39) මොනරාගල වැසියන් ''කුදහච්චා'' යනුවෙන් ව්‍යවහාර කළේ කුමකට ද?
(1) නිදාගත්තා යන්නට ය. (2) වාඩිවුණා යන්නට ය.
(3) අවදි වුණා යන්නට ය. (4) අසනීප වුණා යන්නට ය.

(40) පහත පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.
''රචනා රීතිය යනු භාෂා භාවිතයේ දී විශිෂ්ට ලෙස කෙරෙන පද ගැළපීමයි. එය ලේඛකයාගේ වචන තෝරා ගැනීම හා වචන ගැළපීමත් කථන ක්‍රමයත් යන දෙකෙහි ම සංකලනයෙන් සකස් වන ප්‍රකාශන උපක්‍රමයකි.''
(1) විශිෂ්ට පද ගැළපීමේත්, වචන තෝරාගෙන කථන ක්‍රමයක් සාදා ගැනීමේත් ඵලය ප්‍රකාශන උපක්‍රමයක් වේ.
(2) වචන තෝරා ගැනීම හා වචන ගැළපීමේ ද කථන ක්‍රමයේ ද සංකලනයෙන් විශිෂ්ට පද ගළපීමක් වන රචනා රීතිය නමැති ප්‍රකාශන උපක්‍රමය සැකසේ.
(3) රචනා රීතිය වචන ගැළපීමේ හා තෝරා ගැනීමේ සංකලනයෙන් සකස් කර ගන්නා පද ප්‍රකාශන උපක්‍රමයක විශිෂ්ට ප්‍රතිඵලයකි.
(4) විශිෂ්ට වචන තෝරා ගැනීම හා ඒවා ගැළපීමේ සංකලනය ලේඛකයා සලකන්නේ රචනා රීතිය නම් ප්‍රකාශන උපක්‍රමය ලෙස ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 21 | S | II |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය : ..................................... සිංහල භාෂාව හා සාහිත්‍යය- II කාලය : පැය 02 යි.**

✳ **ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න.**

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල හෝඩියේ ඇතුළත්,
(අ) නාසික්‍ය (ආ) හ්‍රස්ව ස්වර අක්ෂරය බැගින් ලියන්න.

(ii) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.
(අ) වනෞෂධ (ආ) පූජෝපහාර

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
''පසුගිය වසරේ සහල් නිශ්පාදනය කොතරම් ඉහළ ගියේ ද යත් එයට සරිලන වෙලදපොළ සොයා ගැනීම දුෂ්කර විය.

(iv) පහත දැක්වෙන පදවලට විරුද්ධ පදය බැගින් ලියන්න.
(අ) ආගන්තුක (ආ) අවම

(v) පහත දැක්වෙන පදවල ප්‍රකෘතිය වෙන් කර ලියන්න.
(අ) වැද්දෝ (ආ) ගැමියා

(vi) පහත සඳහන් (අ) සහ (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) දුම්රිය සේවකයෝ වැඩ වර්ජනය කරති යි මගීහු සැක පහළ කළහ.
(ආ) දක්ෂ ශිෂ්‍යාවක් වන්නේ කෙසේ ද?

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාත පදයක් හා අනුක්ත පදයක් ලියන්න.
''කෙළිසෙල්ලමින් මා වැළැක්වීමට තාත්තා වැරවෑයම් කරන්නේ කුමක් නිසා දැයි මට නො වැටහිණි.''

(viii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) දුරදිග බලා කටයුතු කරන (ආ) අවුරුද්දක් පාසා පැවැත්වෙන

(ix) පහත සඳහන් වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.
(අ) සාහිත්‍යකරුවෝ රසිකයන් අපූරු ලොවකට ගෙන යති.
(ආ) ගොවියෝ කල් යල් බලා කුඹුරු වපුරති.

(x) පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාරයන් සඳහා භාවිතා වන සාමාන්‍ය ව්‍යවහාර ලියා දක්වන්න.
(අ) අත්තප්පා (ආ) ඔයනවා (ලකුණු 2x10=20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර ඇසුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වනසේ රචනයක් ලියන්න. රචනය සඳහා යෝග්‍ය සුදුසු මාතෘකාවක් ද යොදන්න. (ලකුණු 25)

(අ) වර්තමානය වන විට දිනකට රිය අනතුරුවලින් සිදු වන මරණ සංඛ්‍යාව අටක් පමණ වන බව හෙළිදරව් වී ඇත. මාර්ග නීති නොපිළිපැදීම, අධික වේගය, බීමත්කමින් රිය පැදවීම, මාර්ග පටු වීම, අධික වාහන ප්‍රමාණය, රියදුරන් හට නිද්‍ද යාම ආදිය තුළින් රිය අනතුරු සිදු වී මිය යෑම්, සදාකාලික පූර්ණ අකර්මන්‍යතාවයට පත් වීම් බහුලය. ඒ තුළින් වැඩි වශයෙන් ම යතුරු පැදි භාවිතා කරන්නන් මිය යන අතර, ඔවුහු තරුණයෝ වෙති. රටට ජීවනාලිය බඳු තරුණයන් මිය යාම රටට මහත් පාඩුවකි. පවුල් පවා අසරණ තත්ත්වයට පත් වෙයි. එමෙන් ම රජයට ප්‍රතිකාර සඳහා වැය බරක් දැරීමට ද සිදුව ඇත.

(ආ) රටක පුරවැසියන්ගේ නිරෝගීකම එම රටේ සංවර්ධනයේ දී ඉතා වැදගත් වේ. ශ්‍රී ලාංකික ජන සමාජය මේ වන විට විවිධ බෝ නොවන රෝගීන්ගෙන් බහුල රටක් බවට පත් වී ඇත. දියවැඩියාව, පිළිකා, හෘදයාබාධ, අධික රුධිර පීඩනය ආදී බෝ නොවන රෝගයන් සඳහා ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව ඉතා ඉහළ ය. මේ සම්බන්ධව සෞඛ්‍යය විශේෂඥයෝ විවිධ මත පළ කරති. ව්‍යායාම ප්‍රමාණවත් නොවීම, වස විසෙන් යුත් ආහාර ගැනීම, අධික ලෙස ආහාර ගැනීම, අවිධිමත් ලෙස ආහාර ගැනීම, මානසික ආතතිය හා ජානමය වශයෙන් බලපාන විවිධ හේතු ගෙන හැර දක්වයි.

(ඉ) ජංගම දුරකථන, රූපවාහිනිය, අන්තර්ජාලය, පරිගණකය ආදියේ ඇතැම් බලපෑම් නිසා ද අපේ ළමයින් වෙතින් කියවීමේ පුරුද්ද ටිකෙන් ටික ඈත් වන බවක් පෙනේ. ළමයින් තුළ කියවීමේ පුරුද්ද ඇති කිරීම පාසලටත්, ගෙදරටත්, රජයටත්, පැවරෙන විශාල වගකීමකි. කියවීමේ පුරුද්ද කුඩා කල සිට ම ඇති කළ යුත්තේ එය සාර්ථක ජීවිතයකට ජය මග වන බැවිනි. 'කියවීම සම්පූර්ණ මිනිසෙකු කරයි' යන කියමන අප අනිවාර්යයෙන් ම වැළඳ ගත යුතු ය.

(ඊ) මිනිසාගේ වැඩ පහසු කර ගැනීම අනාදිමත් කාලයක සිට විවිධ සොයා ගැනීම් හා නිපදවීම් කිරීමට මිනිසා පෙළඹිණි. වාෂ්ප යන්ත්‍රය සොයා ගැනීමත් සමඟ කාර්මික විප්ලවය ඇරඹී වර්තමානය දක්වා ආ ගමනේ මිනිසා සොබාදහමට අභියෝග කරමින් විවිධ ජයග්‍රහණ ලබා ගැනීමට උත්සුක වෙමින් සිටියි. කාර්මික විප්ලවයත් සමඟ ඇති වූ වායු දූෂණය තුළින් හරිතාගාර වායු පරිසරයට මුදා හැරීම, වනාන්තර විනාශය ආදිය නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ ගොස් නාය යෑම, භූමිකම්පා, සුළි සුළං, සුනාමි, ළැව්ගිනි, ගං වතුර ගිනි කඳු පිපිරීම ආදී කාලගුණ විපර්යාසයන් නිසා නොනවතින අරගලයකට මුහුණ දීම ලෝකවාසීන්ට සිදු වී ඇත.

(03) පහත දක්වෙන පාඨය වචන 50 - 60 ත් අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

වංශ කතා අනුව ථූපාරාමයට දීර්ඝ ඉතිහාසයක් ඇති බව වටහා ගත හැකිය. සර්වඥ ධාතු තැන්පත් කොට ස්ථූපයක් තැනීම ගැන මිහිඳු මාහිමියන්ගේ සිතේ බලපැවැත් වූ අදහස දැන ගත් දෙවන පැතිස් රජු සර්වඥ ධාතු ලබා ගැනීමට මිහිඳු මාහිමියන්ගේ මග පෙන්වීම යටතේ සුමන සාමණේරයන්ගේ සහය ලබා ගත් බව මහාවංශයේ සඳහන් වේ.

සුමන සාමණේරයන් වහන්සේ වැඩම කර වූ අකු ධාතුව ඇතුළු සර්වඥ ධාතූන් වහන්සේලා ශ්‍රද්ධාවෙන් පිළිගත් රජු එම ධාතූන් වහන්සේලා ඇතෙකු පිට තබා වැඩමවා ඇතා නගරයේ පෙරදිග දොරටුවෙන් පුරයට ඇතුළු වී දකුණු දොරටුවෙන් නික්ම ථූපාරාම ස්ථූපය කළ තැනින් පිටුපස තැන වූ ප්‍රමෝජවස්තු නම් තැනට ගොස් පෙරදිග බලා නතර වූ බව සඳහන් වේ. මිහිඳු මාහිමියන්ගේ උපදෙස් අනුව අභය වැවේ දිය සිඳුණු මැටි ගුලි ගෙන්වා ඇතාගේ කුම්භස්තල ප්‍රමාණ මැටි ගොඩ ගැසීමෙන් පසු ඒ මතුපිට ධාතූන් වහන්සේලා තැන්පත් කොට දින කීපයකට පසු ගඩොල් අල්ලා මැටි ගොඩැල්ල ශක්තිමත් කළ බව සඳහන් වේ. මෙම විස්තරයට අනුව මුල් ම ථූපාරාම ස්ථූපය ක්‍රමවත් සැලැස්මකට අනුව ගොඩනඟන ලද්දක් නොවන බව සිතිය හැකි ය. 13 වන සියවසේ රචිත සාහිත්‍ය කෘතියක් වන ථූපවංශයේ සඳහන් වන්නේ ස්ථූපය වී ගොඩක අනුරුවට කර වූ බවයි. සමන්ත පාසාදිකාවේ හා සිංහල බෝධිවංශයේ සඳහන් වන්නේ ථූපාරාමය ධාන්‍ය ගොඩකට සමාන වන ලෙස ගොඩනඟන ලද බවයි. මේ කරුණු විමසා බලන විට පැහැදිලි වනුයේ ථූපාරාමය මැටි ගොඩක් වටකොට ගඩොල් අල්ලා කිසිම සැලැස්මකින් තොරව ගොඩනඟන ලද බව නොව, කිසියම් නිශ්චිත ආකාරයකට තැන වූ බව ය. (ලකුණු 10)

(04) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

යථාර්ථය නිරූපණය යනු සත්‍ය නිරූපණයක් නොවන සත්‍ය ගවේෂණයකි. මතුපිට වාර්තා කිරීම, යථාර්ථය නොවේ. මතුපිට විනිවිද ගොස් අභ්‍යන්තරය දැකීම යථාර්ථය වේ. මේ සඳහා ලේඛකයාගේ නිරීක්ෂණ ශක්තියට හා පරිකල්ප ශක්තියට හිමි වන්නේ සුවිශේෂ තැනකි.

සමාජයෙහි ජීවත්වීමේ කාර්යයේ දී මිනිසා විසින් අත්‍යවශ්‍ය වූ නිශ්චිත සම්බන්ධතා ඇති කර ගනු ලැබේ. මේ සම්බන්ධතා ඇති කර ගැනීම ඔහුගේ කැමැත්තට අනුව ම සිදු වන්නේ නැත. මෙසේ ඇති කර ගනු ලබන සම්බන්ධතා වනාහි මිනිසාගේ භෞතික නිෂ්පාදන බලවේගයන්ගේ වැඩීමෙහි නිශ්චිත අවස්ථාවන්ට අනුකූල වන්නා වූ නිෂ්පාදනය මුල් කර ගත් සම්බන්ධතා වෙයි. මෙම නිෂ්පාදන සම්බන්ධතා සියල්ල එකතු වීමෙන් සමාජයේ ආර්ථික සංස්ථිතිය ඇති වෙයි. එසේ ම මෙම ආර්ථික සංස්ථිති සමඟ සමාජ විඥානයේ නිශ්චිත ස්වරූප ද සැසඳෙන්නේ ය. ජීවිතයේ නිෂ්පාදන මාර්ග සාමාන්‍ය වශයෙන් සාමාජික, දේශපාලනමය හා බුද්ධිමය ජීවන රටාව හැඩ ගන්වයි. මිනිසාගේ පැවැත්මට සකස් කෙරෙනුයේ ඔහුගේ විඥානය විසින් නොවේ. මිනිසාට හුදෙකලාව ජීවත් විය නොහැකි ය. මේ නිසා ජන සමාජයක චින්තන - වින්දන ශක්තිය නිරන්තරයෙන් ම වෙනස් වේ. ඒ වෙනස්වීම අනිවාර්ය ද වේ. තතු එසේ වුවත් ඒ වෙනස්වීම ජන සමාජයේ අර්ථ සිද්ධිය වෙතට යොමු කිරීම අවශ්‍යය. මේ සඳහා ශක්තිය ඇත්තේ සාහිත්‍ය කලාවන්ට ය. මිනිසාගේ ජීවන ධාරිතාව පෘථුල කොට ජීවිතය පිළිබඳ අර්ථවත් දැක්මක් ඉදිරිපත් කළ හැක්කේ ද සාහිත්‍ය කලාවන්ට ය.

සාහිත්‍යය කලා විචාරයේ දී ගුරු කොට ගත යුත්තේ මේ කල්පනයයි. එය සැබැවින් ම මිනිසාගේ චින්තනයට අදාළ දෙයකි. තතු එසේ නම් සාහිත්‍ය කලා අධ්‍යනය බුද්ධිමය ව්‍යාපාරයක් බව කිය යුතු නැත.

(i) මෙම ඡේදයට අනුව යථාර්ථය නොවන්නේ කුමක් ද?
(ii) යථාර්ථය දැකීම සඳහා ලේඛකයා සතු විය යුතු ගුණාංග කවරේ ද?
(iii) සමාජයේ ආර්ථික සංස්ථිතිය ඇති වීම කෙරෙහි බලපාන සම්බන්ධතා මොනවා ද?
(iv) 'මිනිසාට අර්ථවත් දැක්මක් ඇති වන්නේ කුමක් තුළින් ද?
(v) මෙම ඡේදයට අනුව එළඹිය හැකි අවසාන නිගමනය කුමක් ද? (ලකුණු 2x5=10)

(05) වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් තුන්වන වරටත් සංවිධානය කරන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ''විය සපිරි තරු සුපිරි'' සංගීතමය වැඩ සටහනේ අවසන් මහා තරගය සංවිධානය කර ඇත. එය 2020 මැයි මස 25 වන දින ප.ව. 6.00ට වයඹ පළාත් සභා 'ලිච්ඡවී'' ශ්‍රවණාගාරයේ පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහ මහතා පැමිණෙයි. මේ පිළිබඳව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් කුරුණෑගල දිසාපතිතුමා වෙත යවන ආරාධනා පත්‍රයක් සකසන්න. (ලකුණු 15)

**නැතහොත්**

ගම්පහ නගරයේ ඩෙංගු රෝගීන්ගේ වැඩිවීමේ ප්‍රවණතාවක් තිබෙන බව ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ගම්පහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී හෙළිදරව් කළේ ය. නිවාසවල සහ පොදු ස්ථානවල ජලය රැඳෙන භාජන ස්ථානවල මදුරු කීටයන් බෝවීම තුළින් ඩෙංගු කීටයන් බෝවීම වැළැක්වීමට නගර වාසීන්, වෙළෙඳසැල් හිමියන් හා රාජ්‍ය ආයතන නිලධාරීන් දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 | S | III

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ...................................... සිංහල භාෂාව හා සාහිත්‍යය- III කාලය : පැය 02 යි.

වැදගත් :

✳ දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
✳ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු සංඛ්‍යාව ලකුණු 80කි.

(01) (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''ඒ බමුණා වහ වහා ම දිවගෙන ගොස් සේනාව මැදට පැන මෙසේ කියාලීය.''
(අ) ඉහත පාඨය ඇතුළත් වනුයේ සතර කන් මන්ත්‍රණයේ කුමන කොටසේ ද?
(ආ) ඒ බමුණා කියනු ලැබුයේ කුමක් ද?

(ii) ''යටත්නි, ම පුතු මා කෙරෙහි නොබිඳැ - පියටියාව'යි - නෙරූ-පීයැ.''
(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියෙහි රචකයා නම් කරන්න.

(iii) (අ) සද්ධර්මරත්නාවලිය කෘතියෙහි රචකයා නම් කරන්න.
(ආ) සද්ධර්මරත්නාවලිය ලියූ යුගය කුමක් ද?

(iv) යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කැර එකසී
.........................................................................
.........................................................................
ඉහත පද්‍යයේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
(අ)
(ආ)

(v) (අ) සිංහල ජන ජීවිතය පිළිබඳ ව ඉංග්‍රීසි භාෂාවෙන් ලියැ වූ ඔබට නියමිත නවකතාව කුමක් ද?
(ආ) එම සුවිශේෂී නවකතාවේ කතුවරයා කවුරුන් ද?

(vi) (අ) ජාතික තොටිල්ල පද්‍ය නිර්මාණයේ රචකයා නම් කරන්න.
(ආ) එම රචකයාගේ මුල් ම කාව්‍ය කෘතිය කුමක් ද?

(vii) (අ) ''සිංහල ෂෙලී'' යන විරුදාවලිය ලත් කවියා කවුරුන් ද?
(ආ) එම කවියා හා සමකාලීන කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(viii) අසිරිමත් වූ දේකි මෙලොව
ප්‍රේමය නමිනා
වැනූ පොරණ කිවිඳුන් සොඳ
රස මුසු බසිනා....
(අ) ඉහත ගීත කොටස ඇතුළත් නිර්මාණය කුමක් ද?
(ආ) එම නිර්මාණය රචනා කිරීමට තේමා කර ගනු ලැබූ කතා පුවත ඇතුළත් කෘතිය කුමක් ද?

(ix) රන් විමනේ සිටිමුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩගිනි නැද්ද
.........................................................................
.........................................................................
ඉහත පද්‍යයේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(අ)
(ආ)

(x) (අ) සද්ධර්මරත්නාවලිය ලිවීමට පාදක කරගත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය ලියූ රචකයා නම් කරන්න. (ලකුණු 2X10=20යි)

(02) (i)''රජ්ජුරුවන්ට පටහැනි වීම නම් යුක්ත නොවෙයි. - සිතා, රජ්ජුරුවන් හා සමඟ නික්මුණාහ.''

(අ) මෙහි සඳහන් රජතුමා කවුරුන් ද? රජතුමා සමඟ නික්මුණු තැනැත්තා කවරහු ද?

(ආ) මෙම කොටස හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) වෙසෙසින් යන නද **දිගත** පුරායා
අසමින් **තුරු හිස** රඳන ගිරායා
උමුවෙන් ගත් මී අඹ මියුරායා
දැමුවෙන් වෙණ නද ම ය මියුරායා

(අ) අංකිත පදවල අරුත් ලියන්න.

(ආ) මුළු කවියේ ම අර්ථය ලියන්න.

(iii)''කිම, මහරජ, තට බිම්සර මහරජ කුපිත වියැ හො? විසාලා මහනුවර වැසි ලිච්ඡවි රජහු කුපිත වූහ හො? සෙසු ප්‍රතිපක්ෂ රජ කෙනෙක් කුපිත වූහ හො? යි''

(අ) මෙසේ ප්‍රකාශ කරනු ලබන්නේ කවරහු ද? කා හාට ද?

(ආ) ඉහත ප්‍රකාශය අවසානයේ ලැබෙන පිළිතුර කුමක් ද?

(iv) ''සත් වන දවස් බොහෝ දෙනෙක් රැස්ව මැසි මත්තේ මැසිලා ගත්හ.''

(අ) ''මැසි මත්තේ මැසිලා ගත්හ.'' යන්නෙහි අදහස කුමක් ද?

(ආ) මැසි මත්තේ මැසිලා ගනු ලැබුවේ කුමක් සඳහා ද?

(v) අපල ගෙන දෙන අසුබ නිමිති ඇත්තේ යයි ද **අවතාර** **අඩිකෝඩවලින්** පිරුණේ යයි ද ප්‍රසිද්ධව ගිය මේ ගෙයි වාසයට ඒමට තරම් **සැහැසිවූ** කිසිවෙක් ගමේ නොවූහ.

(අ) අංකිත පදවල අරුත් ලියන්න.

(ආ) ඉහත කොටසෙහි සඳහන් නිවසෙහි හිමිකරු කවුරුන් ද? (ලකුණු 4 x 5 = 20යි)

(03) (i) මිනිස් දහසක් මරන්නට ''අහිංසක'' පෙළඹුණ ආකාරයත්,

(ii) බුදුහිමි සතු පුරිසදම්ම සාරථී ගුණය ඉස්තු වන ආකාරයත්,
මනා ලෙස නිරූපණය කිරීමට කතුවරයා සමත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් විමසන්න.

**නැතහොත්**

(i) අවස්ථෝචිතව විරිත් වෙනස් කිරීමත්

(ii) අවට රැස්වූවන්ගේ ස්වභාවය වර්ණනා කිරීමත් නිසා ගුත්තිල කාව්‍ය රසවත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න. (ලකුණු 15යි)

(04) (i) උග්ගසේන සිටුපුත්‍රයා ජීවිතයේ අභියෝග ජය ගත් ආකාරයත්,

(ii) කතා පුවත ඉදිරිපත් කිරීමේ දී ඒ ඒ චරිත හා අවස්ථාවට අනුකූලව භාෂාව හසුරුවා ඇති අයුරුත් ඉතා විශිෂ්ට ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්,**

(i) වනය විසින් ගම යටකර ගැනීමත්,

(ii) පුංචි මැණිකාගේ චරිතය නිරූපණය කර ඇති ආකාරයත්, නිර්දිෂ්ට පාඩමෙන් උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න. (ලකුණු 15යි)

(05) උචිත රූපකාර්ථ යොදා ගනිමින් ජාතික හැඟීම් පාඨකයා තුළ ජනිත කිරීම ජාතික තොටිල්ල පද්‍ය පන්තියෙන් පෙන්වා දෙයි. උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(06) ''හානාහීය පානා අඬහැරෙන් දූනේ.'' කවි පෙළ රසවත් කිරීම සඳහා කවියා යොදා ඇති කාව්‍යාලංකාර උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(07) සිංහබාහු නව ලොවක් අපේක්ෂා කළ තරුණයකි. උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.
(ලකුණු 10යි)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

21 | S | I,II,III

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

### සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - 3 | (11) - 4 | (21) - 1 | (31) - 4 |
| (2) - 2 | (12) - 2 | (22) - 3 | (32) - 1 |
| (3) - 1 | (13) - 3 | (23) - 2 | (33) - 3 |
| (4) - 4 | (14) - 2 | (24) - 4 | (34) - 2 |
| (5) - 1 | (15) - 4 | (25) - 4 | (35) - 1 |
| (6) - 3 | (16) - 1 | (26) - 1 | (36) - 2 |
| (7) - 3 | (17) - 2 | (27) - 3 | (37) - 3 |
| (8) - 2 | (18) - 1 | (28) - 3 | (38) - 3 |
| (9) - 2 | (19) - 3 | (29) - 2 | (39) - 1 |
| (10) - 1 | (20) - 1 | (30) - 2 | (40) - 2 |

(ලකුණු 1 x 40 = 40)

## II පත්‍රය

(01) (i) (අ) ඛ, ඤ, ණ, න , ම

(ආ) අ, ඇ, ඉ, උ, ඍ, ඏ, ඕ, ඖ

(ii) (අ) වන + ඖෂධ

(ආ) පූජ + උපහාර

(iii) නිෂ්පාදන, වෙළඳපොළ

(iv) නේවාසික, උපරිම

(v) (අ) වැදි + ඕ

(ආ) ගැමි + ආ

(vi) (අ) දුම්රිය සේවකයන් වැඩ වර්ජනය කරති යි මගීහු සැක පළ කළහ.

(ආ) දක්ෂ ක්‍රීඩිකාවක වන්නේ කෙසේ ද?

(vii) නිපාත - යි, නො, නිසා

අනුක්ත - මා, තාත්තා

(viii) (අ) දූරදර්ශී

(ආ) සාංවත්සරික

(ix) (අ) සාහිත්‍යකරුවන් විසින් රසිකයෝ අපූරු ලොවකට ගෙන යනු ලබති / ලැබෙති / යැවෙති.

(ආ) ගොවියන් විසින් කල් යල් බලා කුඹුරු වැපිරෙයි. /වපුරනු ලැබෙයි / ලබයි.

(x) (අ) කිරිඅත්තා

(ආ) ලෙලිගහනවා. (ලකුණු 2x10=20)

(02) සුදුසු ලෙස මාතෘකා පිළිගෙන සම්මත ක්‍රමය අනුව රචනයකට ලකුණු පිරිනමන්න.

(i) සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළුව
ලකුණු 08

(ii) සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය
ලකුණු 12

(iii) ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම
ලකුණු 05

**(මුළු ලකුණු 25)**

(03) සාරාංශය

(i) අන්තර්ගතය = ලකුණු 06

(ii) වචන ගණන = ලකුණු 02

(iii) ශිල්පීය දක්ෂතා = ලකුණු 02

**(මුළු ලකුණු 10)**

අන්තර්ගතය

* වංශකතා අනුව ථූපාරාමයට දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියයි.
* මිහිඳු හිමියන්ගේ අදහසට අනුව සර්වඥ ධාතූන් තැන්පත් කිරීම සඳහා දෙවන පෑ තිස් රජු සමග සාමනේරයන්ගේ සහය ලබා ගනියි.
* අභය වැවේ මැටිගෙන ධාතූන් වහන්සේලා තැන්පත් කොට සෑදූ මුල් ම ස්ථූපය ථූපාරාමයයි.
* එය ඇතුන්ගේ කුම්භස්තලය මෙන් මැටි ගොඩගසා ගඩොලින් බැඳීම ක්‍රමවත් සැලැස්මකට අනුව සිදු වූ බව සිතිය හැකි ය.

* නමුත් මූලාශ්‍රවල දක්වෙන්නේ වී ගොඩක අනුරුවට හා ධාන්‍ය ගොඩකට සමානව ගොඩ ගසා ඇති බවයි.

* මේ අනුව පෙනී යන්නේ සැලැස්මකට අනුව ගොඩනගන ලද්දක් නොව කිසියම් නිශ්චිත ආකෘතියකට තැන වූ බවයි.

(ලකුණු 2x5=10)

(04) (i) මතුපිට වාර්තා කිරීම.

(ii) නිරීක්ෂණ ශක්තිය හා පරිකල්පන ශක්තිය

(iii) නිෂ්පාදන සම්බන්ධතා

(iv) සාහිත්‍ය කලාවන් තුළින්

(v) සාහිත්‍ය කලා අධ්‍යනය බුද්ධිමය ව්‍යාපාරයක් බවයි. (ලකුණු 2x5=10)

(05) ආකෘතිය ලකුණු 05

අන්තර්ගතය ලකුණු 07

ශිල්පීය දක්ෂතා ලකුණු 03

මුළු ලකුණු 15

## III පත්‍රය

(01) (i) (අ) ධර්ම යුද්ධය කොටස

(ආ) ගොවියා පුතු නොවැන්ද බව / මහෞෂධ පණ්ඩිතයිනට නොවැන්ද බව

(ii) (අ) අමාවතුර

(ආ) ගුරුළුගෝමී පඬිතුමා

(iii) (අ) ධර්මසේන හිමි

(ආ) දඹදෙණි යුගය

(iv) (අ) අහසින් බැස රඟගත් රඟ කෙලෙසී

(ආ) දිසි මෙන් විය විදුලිය සිය දහසී

(v) (අ) Village in the jungle / විලේජ් ඉන් ද ජංගල්

(ආ) ලෙනාඩ් වුල්ෆ් මහතා

(vi) (අ) එස්. මහින්ද හිමි

(ආ) ඔවා මුතු

(vii) (අ) එච්. එච්. කුඩලිගම කවියා

(ආ) පී. බී. අල්විස් පෙරේරා, කපිල සෙනෙවිරත්, මාකඳුරේ ගුණවර්ධන, මිමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර

(viii)(අ) සිංහබාහු නාට්‍යය

(ආ) මහාවංශය

(ix) (අ) මිණිබරනින් සැදූ මුත් ගත නොදිරද්ද

(ආ) පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද

(x) (අ) ධම්මපදට්ඨ කතාව

(ආ) බුද්ධඝෝෂ හිමි

(ලකුණු 2x10=20)

(02) (i) (අ) චූලනී බ්‍රහ්මදත්ත රජු, කේවට්ට බමුණා

(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජු මහත් සේ කෝපයට පත්ව මියුලු නුවර වැටලීමට අටළොස් අක්ෂෞහිනියක් සේනාව සමඟ නික්මෙන අවස්ථාවේ කේවට්ට බමුණා ඒ සමඟ නික්මෙන අවස්ථාව

(ii) (අ) දිගත - දිගන්තය / දස දෙස / දිශාවන්හි

තුරුහිස - ගස් මුදුන් / ගස් උඩ

(ආ) දිගන්තය පුරා / දස පුරා පැතිරී යන වීණා නාදය විශේෂයෙන් අසමින් ගස් මුදුන්වල සිටින ගිරවු ආශාවෙන් ගත් මියුරු මී අඹ ඉවත දමා ඉතා මියුරු වීණා නාදය ඇසුහ.

(iii) (අ) බුදුරජාණන් වහන්සේ

කොසොල් රජතුමාට

(ආ) වහන්සේ මට දෑහැවි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති, / මා සමඟ කේන්තිගත්, කෝප වූ රජ කෙනෙක් නැත. මාගේ රට අගුල්මල් සොරෙකු සිටී ඔහු ගන්නට යන බවයි.

(iv) (අ) මැසි උඩ මැසි ගසා ගැනීම.

(ආ) උග්ගසේන සිටු පුත්‍රයාගේ නැටුම් ශිල්පය බැලීම / නැරඹීම සඳහා

(v) (අ) අවතාර අඩිකෝඩ - හොල්මන් ගැවසෙන කලබල / විකාර

සැහැසි - දරුණු වූ / සහාසික වූ / එඩිතරකමක් පෙන්වන

(ආ) ආරච්චි

(ලකුණු 4X5=20යි)

(03) (i) **මිනිස් දහසක් මරන්නට පෙළඹුණ ආකාරය**

★ අහිංසක තක්ෂලාවේ ධර්මාන්තෙවාසිකව ශිල්ප උගනිමින් පරමාදර්ශී ශිෂ්‍යයෙකු ලෙස හැසිරෙයි.

''වත් සැපැනැ, කී කී දෙය වහා සපයයි, පෙම් වඩන න්‍යායෙන් බෙණෙයි.

★ අනෙකුත් ශිෂ්‍යයෝ අහිංසක කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් ගුරුතුමාට කේලාම් කියා ඔහු සමඟ බිඳවීමට උත්සාහ කිරීම

''අහිංසක මානවකයා ආ තැන් පටන් ඇපි නොපෙනෙම්හ''

''ආචාර්යයා, අඹුව හා සසඟ ඇත්තේ යයි බිඳ පියමිවා.''

''තුන් රැසක් පළමු ඇතැම් කෙනෙක් ආචාර්යයා එළඹ වැද සිටියාහ!

''ආචාර්යා ඔවුන් තමා සනා ඇතිවැ බණන සෙ දැක.''

''පුතැ, මිනිස් දහසක් මැරුව මැනැවැ. එ සෙ වන්නා ශිල්පයට උපචාර කළා වෙ.''

(ii) **බුදුහිමි සතු පුරිසදම්ම සාරථී ගුණය ස්මතු වන ආකාරය**

- ★ බුදුන් වහන්සේ දෙව්රම් වෙහෙරෙයි වැඩ සිටින විට ලොව බලද්දී අහිංසකගේ මව පුතු සොයා යන බව දැන අංගුලිමාල ආනන්තරිය පාපකර්මයෙන් මුදවා ගැනීම.
- ★ එදවස් බුදුහු දෙව්රෙමෙහි වෙසෙමින් මා ගිය කළ ඔහුට සෙත්වෙයි.
- ★ බුදුන් වහන්සේ අංගුලිමාල සොයා යද්දී ගොන් රක්නා මිනිසුන් සොරා පිළිබඳව විස්තර කිරීම.

''මහණ එමගට නොයා ඒ මඟ අගුල්මල් නම්.... සොරක .... බුදුහු ඔවුන් තුන් යලක් කියතුදු නොබැණ නැගී වැඩියෝ.

''මේ මහණ මැරුව මැනැවයි.''

''බුදුන් පස් පස් ලුහු බඳියි.''

''බුදුහු මම සිටියෙමි. තෝ ද සිටයි. වදාළො.

''මෙතැන් තැන් පටන් ගෙන පව් නොකරමි. තොපගේ මියුරු කථා අසා යැ'යි.''

නැතහොත්

(i) සරල විරිත - සරල විරිතෙන්

''ගුත්තිල ඇඳුරු සඳ'' } පද්‍ය 1- 13 දක්වා
''දෙදෙනම ඉද දෙපිට'' } මහපියුම් / ගී විරිත

- ★ රස ජනනය වන පරිදි අවස්ථෝචිතව විරිත් වෙනස් වන අවස්ථා

- කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ...
- දිය දිය ගොස පල කෙරෙමින් සැපැමිණි...
- රූ රසේ අදිනා ලෙසේ අත් .....

(පද්‍ය 14-32 සොළොස්මත් විරිත / පෙඳ විරිත) පද්‍ය 33- 34 සවිසිමත් විරිත නුපුන් සඳ විරිත)

(ii) අවට රැස්වූවන්ගේ ස්වභාවය වර්ණනා කිරීම.

''සතොස් කරන විණා නද ඇසුමට''

''අසන රිසින් නයි කැල ඔසලෝයා''

''නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ.....

''පන්සිල් වීණා නද පසු බැස්සු ......''

(ලකුණු 15යි)

(04) (i) **උග්ගසේන අභියෝග ජය ගත් ආකාරය**

''ලදොත් ජිවත්වෙමි, නොලදොත් මියෙමියි.'' කියා මාරාන්තික උපවාසයක යෙදී ඇයව ලබා ගැනීම

''ගැල් රකිනවුගේ පුත, කුමක් නොදන්නාහුගේ පුත කිය කියා නළවයි.''

''තොප ගිය මැනව, හුන මැනව.''

''ඇගේ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමි.''

''මෙතනට සත් වන දවස් මම ශිල්ප දක්වමි.''

උග්ගසේන සිටු පුත්‍රයා හුණදඬු අග දී පිළිසිඹියා පත් රහත්ව හුණ දණ්ඩෙන් බැස පියා බුදුන් ළඟට ගොස් පසඟ පිහිටුවා වැඳගෙන මහණ කරන්න ආරාධනා කළහ.

(ii) **භාෂාව හසුරුවා ඇති ආකාරය**

- ★ අවස්ථෝචිතව සංවාදයෙන් ඉදිරිපත් කරන සිද්ධි නිරූපණය

''මේ හැම මා අරභයා කවු ද?

එසේය අනික් කාට කියමි ද?

තොප ගිය මැනව හුන මැනව.

**උපමා භාවිතය**

- අවකප්පනයෙන් සැදූ හසු රැන අල්වා ඇදි ඇදි සේ දුවන්නා සේ''......
- පැසුණු ගොයම් මුල් වුවා සේ.....

**නැතහොත්**

(i) **වනය විසින් ගම යට කර ගැනීම.**

- සිළිඳු අතින් ආරච්චිත්, ප්‍රනාන්දුත් මරණයට පත් ව ගෙවල් පාළු වී යාම.
- ★ නැංචොහාමි දරුවන් සමඟ ඇගේ ගමට යාම නිසා එම ශක්තිමත් නිවස ද කැලයට යාම.

- ''එක පහරට එක දවසින් එහි තිබුණ ගෙවල් හයෙන් එකක් නැති විය. විසි පස් දෙනෙක් වූ පිරිසෙන් හත් දෙනෙක් ම නැති වූහ.''

- ★ ආරච්චිගේ ගෙයි වාසය කිරීමට කෙනෙකු නොවූ හෙයින් එය කැලයට ඇරිණ.''

(ii) **පුංචි මැණිකාගේ චරිත නිරූපණය**

- පුංචි මැණිකා තම පියාට මෙන් ම තම ස්වාමියා වූ බබුන්ට ද ආදරය සෙනෙහස දැක්වීම.
- පුංචි මැණිකා බවුන් එනතුරු බලා සිටියාය.''
- පුංචි මැණිකාගේ කලබල නැති ගතියක් සාන්ත යටහත් පහත් ගතියත් නිසා කවුරුත් ඇට ප්‍රිය කළාය.
- පුංචි මැණිකා බබුන් සොයා හිර ගෙදරට ගිය අවස්ථාවේ පුංචි මැණිකා හිරපල්ලාගෙන් තොරතුරු විමසූ අවස්ථාව
- පුංචි මැණිකා අභියෝග හමුවේ ඉවසීමෙන්, අධිෂ්ඨානශීලීව මුහුණ දුන් ආකාරය

(ලකුණු 15යි)

(05) **උචිත රූපකාර්ථ යෙදීම**

★ බාල අවධියේ සිට ම රට දැය පිළිබඳ හැඟීමකින් යුතුව යුතුකම් ඉටු කිරීමට උත්සාහ දැරීම.

- නිදහස මහ මුහුදක් වේ.''

- එහි උල්පත පුත නුඹ වේ.''

- ජාතිය රන් විමනත් වේ.

- ආගම මිණි පහනක් වේ.

ඔහු මෙළොවට පහළ දෙවි

රජෙකැයි සලකනු මැනවි

මෙහි යෙදී ඇති පද රූපාකර්ථ සහිත යෙදුමය.

(ලකුණු 10යි)

(06) **හානාහීය පැදි පෙළේ කව්‍යාලංකාර යෙදීම.**

★ අප්තෝපදේශ සහිත සාම්ප්‍රදායික යොදුම් බහුලව යොදා තිබීම.

ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු .....

දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා ......

★ පාදාන්ත එළි සමය යොදා තිබීම.

ගැළපෙන නිදසුන් ලියා තිබීම.

★ උපමා යොදා තිබීම

''එක් උනදාට උක් දණ්ඩේ පැණි සේමා .....යන කවි නිදසුනකි.

★ විධික්‍රියා පද සහිත වියරණ විදි යොදා ගැනීම

''ළිඳ කපනු,

උඩ පනිනු

කඳ බඳිනු

කල් හරිනු''

★ ප්‍රශ්නාර්ථ යෙදුම් භාවිතය

රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද ... යන කවිය

(ලකුණු 10යි)

(07) **සිංහබාහු නව ලොවක් අපේක්ෂා කළ ආකාරය**

★ මහ වන මැදක, ගිරි ලෙනක ගෙවන ජීවිතය එලක් නොමැති බව.

''සිත නොම සැනසේ හිඳිනට මෙ ලෙසේ

දිවි හිමියෙන් මෙ ලෙනේ...

★ පියතුමා හා අන් අය අතරෙහි වෙනස දැකීම.

''පියතුමගේ ගත නැරඹූ කල සිත කුහුලින් ඉතිරෙන්නේ.....

★ ඔබ දෙදෙන මා සමඟ නොආවොත් යන්ට වේ ඔබ දමා මෙ ලෙනේ....

අදාළ වෙනත් උදාහරණ ද යොදා ගත හැක.

(ලකුණු 10යි)